# ආබාධිත පුද්ගලයන් අධ්‍යාපනය හා වෘත්තීය වශයෙන් සවිබල ගැන්වීම වෙනුවෙන් රාජ්‍ය ආයතනවල මැදිහත්වීම



**වාර්තාවේ අංකය : පීඊඑස්/පීඊ/එස්එස්/2015/1**

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

**කාර්යසාධන හා පරිසර විගණන අංශය**

| අනු අංක | | විස්තරය | පිටුව |
|---|---|---|---|
| 1. | | විධායක සාරාංශය | 1 |
| 2. | | හැඳින්වීම | 3 |
| | 2.1 | විගණන විෂය පථය | 3 |
| | 2.2 | විගණනය සඳහා අධිකාර බලය | 4 |
| | 2.3 | මාතෘකාව තෝරා ගැනීමට හේතු | 4 |
| | 2.4 | විගණන ප්‍රවේශය | 4 |
| | 2.5 | විගණන අරමුණ | 5 |
| 3. | 3 | විස්තරාත්මක විගණන සොයාගැනීම්, නිර්දේශයන් සහ ආයතනික ප්‍රතිචාර | 6 |
| | 3.1 | ආබාධිත දරුවන් සඳහා ලබාදෙන අධ්‍යාපනය | 6 |
| | 3.1.1 | රජයේ පාසල් වල විශේෂ අධ්‍යාපන ඒකක සම්බන්ධ නිරීක්ෂණ | 6 |
| | 3.1.2 | විශේෂ පාසල් සම්බන්ධ විගණන නිරීක්ෂණ<br>ආයතනයේ අදහස් දැක්වීම (අධ්‍යාපන අමාත්‍යාංශය) | 7 |
| | 3.2 | ආබාධිත පුද්ගලයන් සඳහා ලබාදෙන වෘත්තිය පුහුණුව සම්බන්ධ නිරීක්ෂණ | 17 |
| | 3.2.1 | වෘත්තීය පුහුණු අධ්‍යාපනය සාර්ථකව නිම කිරීම | 17 |
| | 3.2.2 | කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම | 17 |
| | 3.2.3 | පුහුණුව සම්පූර්ණ කල සිසුන් සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදුකිරීම | 18 |
| | 3.2.4 | අරමුදල් සම්පාදනය | 18 |
| 4. | | නිගමනය | 19 |

## 1. විධායක සාරාංශය

ජීවන මංපෙතේ විවිධ කඩඉම් පසුකරමින් යන මිනිසාගේ එක් සුවිශේෂී අවස්ථාවකි විවාහය. විවාහපත් වූ සෑම යුවලකගේ ම ඒකායන පරමාර්ථය වන්නේ නිරෝගී, බුද්ධිමත් දරුවෙකු බිහිකර ඔහු හෝ ඇය ගුණගරුක, යහපත් පුද්ගලයෙකු ලෙස සමාජයට දායාද කිරීම යි. එසේ වුවත්, සෞඛ්‍යමය ගැටළු හෝ කර්මානුරූප කරුණු හේතු කරගෙන ඇතැම් අවස්ථාවල දී විෂමතා සහිත දරුවන් මෙලොවට බිහි වේ. එ වැනි විෂමතා තිබුණ ද, ඔවුන් සමාජයේ සෙසු සාමාජිකයින් හා සමාන ලෙස ම සැළකිය යුතු පිරිසකි. එ බැවින්, ඔවුන්ගේ අභිවෘද්ධිය උදෙසා රජය විසින් නොයෙකුත් වැඩපිළිවෙලවල් දියත් කර තිබේ.

එ වැනි දරුවන් සමාජයේ සෙසු පිරිස් හා සමතලයක පිහිටුවීම පිණිස ළමා අවධියේදී අධ්‍යාපනික කුසලතාවන් ද, තරුණ අවධියේදී වෘත්තිමය කුසලතාවන් ද අත්පත් කරදීම පිණිස රජය විසින් එම කාර්යයන් ප්‍රධාන වශයෙන් ම අධ්‍යාපන අමාත්‍යාංශය මගින් හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු පාසල් මගින් ඉටුකර ගැනීමට අපේක්ෂා කෙරේ.

විගණනයේ අරමුණු වූයේ ආබාධිත දරුවන් සඳහා ලබාදෙන සෞඛ්‍ය පහසුකම් හා අධ්‍යාපනය ප්‍රමාණවත් ද යන්න සහ අධ්‍යාපනයෙන් පසු ඔවුන් රැකියාවකට යොමු කිරීම හෝ ස්වයං රැකියාවක් කිරීමට හැකිවන සේ ප්‍රමාණවත් වෘත්තීය පුහුණුවක් ලබා දෙන්නේ ද යන්න ඇගයීම වේ.

ඒ අනුව සිදු කළ විගණනයේදී පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකකවලට අනුයුක්ත කර තිබුණු විශේෂ අධ්‍යාපන ගුරු පුහුණුව ලද ගුරුවරුන් එම සේවයෙහි නොයෙදී ආබාධිත නොවන දරුවන් සිටින පන්ති කාමරවල සේවයේ යෙදීම, විශේෂ අධ්‍යාපන ගුරු පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පැවැතීම, විශේෂ අධ්‍යාපන ඒකකය වෙත ප්‍රවේශ වීමට සලසා තිබුණු පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ අධ්‍යාපනික හා සෞඛ්‍ය උපකරණ ප්‍රමාණවත් නොවීම යන කරුණු නිරීක්ෂණය කරන ලදී.

රජයේ විශේෂ පාසල් සම්බන්ධයෙන් ගත්කළ සංඥා භාෂාව භාවිතා කරන ළමුන් සඳහා සම්මත සංඥා භාෂා ක්‍රමවේදයක් නොමැති වීම, පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාග සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාග සඳහා පෙනී සිටින සිසුන්ට ප්‍රශ්න පත්‍ර කියැවීම සඳහා සහභාගී වන ගුරුවරුන් විශේෂ අධ්‍යාපනය හදාරා ඇති ගුරුවරුන් වුවත් ඔවුන් විභාග පරීක්ෂකයන් ලෙස සහභාගී වන විෂයයන් සම්බන්ධයෙන් අවබෝධයක් නොමැති වීමෙන් ගැටළු මතුවීම, සංඥා භාෂාව භාවිතා කරන ළමුන්ට සිය විෂය නිර්දේශය අපේක්ෂිත කාලපරිච්ඡේදය තුළ නිම කිරීමට නොහැකි වීම, විභාග ප්‍රතිඵල ඉතා දුර්වල මට්ටමක පැවතීම යන කරුණු නිරීක්ෂණය කරන ලදී.

අන්ධ සිසුන් වෙත බ්‍රේල් (Braille) මාධ්‍යයේ පෙළ පොත් ලැබුණ ද, රූප සටහන් බ්‍රේල් (Braille) මාධ්‍යයෙන් ඉදිරිපත් කළ නොහැකි වීම, රූප සටහන් ඇසුරින් ඉදිරිපත් කරන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ අපහසුව, විභාග ප්‍රශ්න කියැවීම සඳහා පැමිණෙන ගුරුවරුන්ට දරුවන් පිළිබඳ ව සහ විෂය පිළිබඳ ව අවබෝධයක් නොමැති වීමෙන් එය දරුවාට අවාසි සහගත ලෙස බලපෑම යන කරුණු නිරීක්ෂණය කරන ලදි.

ඉහත නිරීක්ෂණවලට අමතරව ගුරු උපදේශකවරුන්ගේ නොපැමිණීම, වරින්වර සිදුවන විෂය නිර්දේශ වෙනස්වීම් සම්බන්ධව පවත්වන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ ආදිය සඳහා විශේෂ අධ්‍යාපන ඒකකවල හා විශේෂ පාසල්වල ගුරුවරුන් සම්බන්ධ කර ගැනීම ප්‍රමාණවත් නොවීම, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ නොලැබීම, උපස්ථායක කාර්යමණ්ඩල ප්‍රමාණවත් නොවීම ආදිය විශේෂ පාසල් සම්බන්ධයෙන් කරන ලද අනෙකුත් නිරීක්ෂණ අතර විය.

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු පාසල්වලට බඳවා ගන්නා සිසුන් අතරමග දී පාඨමාලාව හැර යාම, පාඨමාලාව සම්පූර්ණ කරන සිසුන්ගේ රැකියාගත වීම් පිළිබඳ නිශ්චිත තොරතුරු සමාජ සේවා දෙපාර්තමේන්තුව සතුව නොතිබීම වැනි කරුණු නිරීක්ෂණය කරන ලදී.

ඉහත දැක්වෙන නිරීක්ෂණවලට අනුව පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක ස්ථානගත කිරීමේදී සිසුන්ට ප්‍රවේශ පහසුකම් ඇති කිරීම, බිහිරි ළමුන් සඳහා සම්මත සංඥා භාෂාවක් හඳුන්වා දීමට කටයුතු කිරීම, විශේෂ අධ්‍යාපනය සම්බන්ධ පුහුණුව ලැබූ ගුරුවරු වෙනත් පන්ති කාමරවල සේවයෙහි යෙදීම වෙනුවට විශේෂ අධ්‍යාපන ඒකකවලට අදාළ ව සේවයෙහි යෙදවීමට කටයුතු කිරීම, ගුරු මාර්ගෝපදේශ නියමිත පරිදි ලබා දීමට කටයුතු කිරීම, විශේෂ පාසල්වල ඉගැන්වීමේ නිරතවන ගුරුවරුන්ට විෂය නිර්දේශ වෙනස්වීම් ආදි විශේෂ තත්ත්වයන් පිළිබඳ අනිවාර්යෙන් දැනුවත් කිරීම සඳහා කටයුතු කිරීම, ප්‍රසිද්ධ විභාගවල දී විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා ප්‍රශ්න පත්‍ර කියැවීමට ඒ දරුවන්ගේ විශේෂ අවශ්‍යතා පිළිබඳ හා විෂය පිළිබඳ අවබෝධයක් ඇති ගුරුවරුන් යෙදවීමට කටයුතු කිරීම, සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් සිය වෘත්තීය පාසල්වල පවතින අවශ්‍යතා පිළිබඳ සොයා බලා ඒවා අප්‍රමාදව සැපයීමට කටයුතු කිරීම, ඔවුන් ලද පුහුණුව ඵලදායක ද යන්න නැවත සලකා බැලීම හා ඉගැන්වීම වෙනුවෙන් දරන ලද පිරිවැයට සාපේක්ෂව ආබාධිත සිසුන් රැකියාගත වීම පිළිබඳ පසුවිපරමක් සිදුකර අපේක්ෂිත අරමුණු ළඟා කරගෙන ඇතිදැයි ඇගයීමේ ක්‍රමවේදයක් සකස් කර ගැනීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

## 2. හැඳින්වීම

ආබාධ සහිත තැනැත්තකු යන්නෙන් සහජයෙන්ම ඇති වූ හෝ එසේ සහජයෙන්ම ඇති නොවූව ද ශාරීරික හෝ මානසික හැකියාවන්හි යම් ඌනතාවක ප්‍රතිඵලයක් ලෙස ජීවිතයේ අවශ්‍යතාවන් මුළුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ තමා විසින් තමා සඳහාම ඉටුකර ගැනීමට නොහැකි වූ යම් තැනැත්තකු අදහස් වේ.

මෙම ආබාධ සහිත පුද්ගලයන්ද සමාජයේ සම සාමාජිකයන් වන අතර, ඔවුන් අයත් ප්‍රජාව තුළ ඔවුනට සමාන අයිතීන් ලැබිය යුතු ය. එනම්, අධ්‍යාපන, සෞඛ්‍ය, රැකීරක්ෂා, ප්‍රවේශ පහසුකම්, සුභසාධන හා වෙනත් ඕනෑම අවශ්‍යතාවක් අනෙකුත් අයට මෙන්ම සමාන ලෙස සැපයිය යුතු ය යන්න ජාත්‍යන්තර වශයෙන් ද පිළිගෙන ඇත.

අධ්‍යාපනය ද සියලුම දරුවන්ගේ මූලික මානව අයිතිවාසිකමක් වන බව 1948 මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය මගින්, 1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය මගින් හා තිරසර සංවර්ධන ඉලක්ක 04 යටතේ ද තහවුරු කර ඇත. ඒ අනුව ශාරීරික හෝ මානසික ආබාධිත දරුවන්ට ද අනෙකුත් දරුවන් හා සමානවම අධ්‍යාපනය ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මෙන්ම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ද මැදිහත් වී ඇත.

1944 ජුලි 10 දින පත් කරන ලද සර් අයිවර් ජෙනින්ග්ස් කොමිසමේ vii වැනි සැසි වාර්තාවේ නිර්දේශ පරිදි, 1948 පෙබරවාරි 01 දින ස්ථාපිත කරන ලද සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ආබාධිත පුද්ගලයන්ට වෘත්තීය පුහුණුව ලබා දීම ද සිදු කෙරේ.

ශ්‍රී ලංකාවේ ආබාධිත බව පිළිබඳ ව්‍යාපාරය විසින් ආබාධිතයන් වෙනුවෙන් ප්‍රතිපත්තියක් සකස් කරන ලෙස වසර ගණනාවක් තිස්සේ රජයෙන් ඉල්ලා සිටීමේ ප්‍රතිඵලයක් ලෙස එවකට සිටි සමාජ සේවා අමාත්‍යවරයා විසින් 1996 අංක 28 දරන ආබාධිත බව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවේ සම්මත කර තිබුණි. ඒ ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් නෛතිකව බලගැන්වීම සඳහා ය.

### 2.1 විගණන විෂය පථය

මෙම කාර්යසාධන විගණනය පහත ක්ෂේත්‍රවල සිදු කරන ලදී.

(අ) රජයේ පාසල්වල ආබාධිත දරුවන් වෙනුවෙන් ලබා දෙන විශේෂ අධ්‍යාපනය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී ශ්‍රී ලංකාවේ ආබාධිත දරුවන් වෙනුවෙන්ම ස්ථාපිත කර ඇති, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ දිවයින පුරා පවතින උපකෘත පාසල් 25 කෙරෙහි විගණනයේදී අවධානය යොමු කරන ලදී. එමෙන්ම, බස්නාහිර පළාත් අධ්‍යාපන

දෙපාර්තමේන්තුව යටතේ පවතින කලාප කාර්යාල, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලවල වූ විශේෂ අධ්‍යාපන ඒකක සහිත පාසල් පරීක්ෂාවට බඳුන් කරන ලදී.

(ආ) ආබාධිත පුද්ගලයන්ට ලබා දෙන වෘත්තීය පුහුණුව පිළිබඳ පරීක්ෂාවේදී සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සියලු වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන විගණනයට භාජනය කරන ලදී.

## 2.2 විගණනය සඳහා අධිකාර බලය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 2.3 මාතෘකාව තෝරා ගැනීමට හේතු

උපතින් හෝ විවිධ මානව ක්‍රියාකාරකම් නිසා හෝ විවිධ පාරිසරික හේතූන් මත හෝ ආබාධිත තත්ත්වයට පත්වන පිරිස දිනෙන් දින ඉහළ අගයක් ගන්නා බව වාර්ෂික සංඛ්‍යාලේඛන පරීක්ෂාවේදී පෙනී යයි. මෙසේ ආබාධිත බවට පත් වුවද, එම ජනතාවටද සමාජයේ අනෙකුත් ජනතාවට හිමිවන සියලු වරප්‍රසාද හිමි විය යුතු ය. එ බැවින් මෙ වැනි පුද්ගලයන් උදෙසා රාජ්‍ය මට්ටමින් විශාල මැදිහත් වීමක් සිදු කරයි.

ආබාධිත දරුවන්ගේ අධ්‍යාපනය උදෙසා අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ද, ආබාධ සහිත වූවන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දෙමින් ඔවුන් සමාජ සංවර්ධනයේ සැබෑ කොටස්කරුවන් බවට පත්කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශය හා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු ද ප්‍රධාන වශයෙන් මැදිහත් වී ක්‍රියා කරන ආයතන වේ.

ඉහත ආයතන මගින් ආබාධිත ප්‍රජාව වෙනුවෙන් වාර්ෂිකව විශාල මුදලක් වියදම් කරන අතර එම වැය කිරීමට සාපේක්ෂව ආබාධිත පුද්ගලයන් හට සමාජය තුළ වටිනාකමක්, පිළිගැනීමක් හා අනන්‍යතාවකින් යුතු ව සමාජ සංවර්ධනයේ සැබෑ කොටස්කරුවන් ලෙස ජීවත් වීමට හැකියාවක් ලැබෙන්නේද යන්න ඇගයීම උදෙසා මෙම මාතෘකාව තෝරා ගන්නා ලදී.

## 2.4 විගණන ප්‍රවේශය

විගණන ප්‍රවේශය සඳහා පහත දැක්වෙන අණපනත්, ගැසට් නිවේදන සහ චක්‍රලේඛවලින් සලසා ඇති ප්‍රතිපාදන සැලකිල්ලට ගන්නා ලදී.

- 2003 අංක 33 දරන පනතින් සංශෝධිත 1996 අංක 28 දරන හා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත
- 2003 ආබාධිතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

- විශේෂ අධ්‍යාපනය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සහ බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ
- අදාළ අනෙකුත් ලියකියවිලි සමාලෝචනය සහ සම්බන්ධිත නිලධාරීන්ගෙන් කරන ලද විමසීම්

## 2.5 විගණන අරමුණ

මෙම කාර්යසාධන විගණනයේ මූලික අරමුණ වනුයේ, ආබාධිත පුද්ගලයන්ට සමාජයේ අනිකුත් පාර්ශවයන්ට හිමි සියලු අයිතිවාසිකම් හිමි වන්නේ ද යන්න ඇගයීම ය. එනම් ආබාධිත කුඩා දරුවන්ට විශේෂ අධ්‍යාපනයත්, පසුව වෘත්තිය අධ්‍යාපනයත් එක් එක් රාජ්‍ය ආයතන විසින් ලබාදීමේ කාර්යසාධනය ඇගයීමයි.

## 3. විස්තරාත්මක විගණන සොයාගැනීම්, නිර්දේශය සහ ආයතනික ප්‍රතිචාර

### 3.1 ආබාධිත දරුවන් සඳහා ලබා දෙන අධ්‍යාපනය

ආබාධිත දරුවන්ගේ අධ්‍යාපනය, ක්‍රමානුකූල හා පිළිගත් ක්‍රමවේදවලට අනුව මනෝ විද්‍යාත්මක මූලධර්ම උපරිම ලෙස සැලකිල්ලට ගෙන ලබා දිය යුතු ය. ඒ සඳහා මානව හා භෞතික සම්පත් මෙන් ම සුදුසු පරිසරයක් ද අවශ්‍ය වේ. මෙ වැනි අධ්‍යාපන ක්‍රමයකින් ආබාධිත ළමුන් සමාජගත කිරීමේ අරමුණ ක්‍රමානුකූල ව ඉටු කරගත හැකි වේ.

### 3.1.1 රජයේ පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක සම්බන්ධ නිරීක්ෂණ

(අ) බස්නාහිර පළාතේ රජයේ පාසල්වල ඇති විශේෂ අධ්‍යාපන ඒකක 25කට අදාළ ව 2014 වර්ෂයේ දී සිදු කළ භෞතික පරීක්ෂණවලට හා එම ඒකක පිළිබඳ ව කොට්ඨාශ මට්ටමින් ලබාගත් තොරතුරු අනුව මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් නොවන අවස්ථා පවතින බව තහවුරු විය. එනම්, පාසල් 15ක වූ විශේෂ අධ්‍යාපන ඒකකවලට ප්‍රවේශ පහසුකම් නොමැති වීම, පාසල් 13ක අධ්‍යාපනික උපකරණ නොමැති වීම, පාසල් 19ක ගොඩනැගිලි හා වැසිකිළි පහසුකම් නොමැති වීම හා පාසල් 4ක ගුරු හවතුන් නොමැති වීම යන කරුණු ය.

(ආ) **විශේෂ අධ්‍යාපනයට අදාළ ගුරු උපදේශකවරුන් හා විෂය අධ්‍යක්ෂකවරුන්ගේ තනතුරු පුරප්පාඩු වීම.**

පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකකවලට අවශ්‍ය ගුරු උපදේශකවරුන්ගේ අනුමත සංඛ්‍යාවක් නොතිබූ අතර බස්නාහිර පළාතේ අධ්‍යාපන කොට්ඨාශ 38ක පැවැති විශේෂ අධ්‍යාපන ඒකක සහිත පාසල් 171ක් සඳහා අනුයුක්ත කර තිබුණු විශේෂ අධ්‍යාපන ගුරු උපදේශකවරුන්ගේ සංඛ්‍යාව 17දෙනෙකු පමණක් වූ අතර අධ්‍යාපන කලාප 11න් විශේෂ අධ්‍යාපනය සම්බන්ධ විෂය අධ්‍යක්ෂවරුන් කලාප 03 ක වැඩ ආවරණය කරන පදනමේ සිටින බව ද නිරීක්ෂණය විය.

2015 මැයි 13 දිනට

| කලාපය | විශේෂ අධ්‍යාපන ඒකක සහිත පාසල් සංඛ්‍යාව | කලාපයට අනුයුක්ත කර ඇති ගුරු උපදේශකවරුන් සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 16 | 02 |
| ජයවර්ධනපුර | 14 | 02 (වැඩ ආවරණය කරන) |
| පිළියන්දල | 17 | 01 |
| හෝමාගම | 11 | 01 (වැඩ ආවරණය කරන) |
| ගම්පහ | 10 | 02 |
| මීනුවන්ගොඩ | 15 | 02 |
| කැළණිය | 17 | 02 |
| මීගමුව | 19 | 02 |
| කළුතර | 16 | 02 |
| මතුගම | 20 | 01 (වැඩ ආවරණය කරන) |
| හොරණ | 16 | නැත |

**3.1.2 විශේෂ පාසල් සම්බන්ධ විගණන නිරීක්ෂණ**

අන්ධ, බිහිරි හා වෙනත් ආබාධිත දරුවන් සඳහා අධ්‍යාපනය ලබා දීම වෙනුවෙන් දිවයින පුරා ස්ථාපිත කර තිබුණු විශේෂ පාසල් 25ක් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි වේ.

**(අ) විශේෂ අධ්‍යාපන ඒකක හා විශේෂ පාසල්වල අධ්‍යාපනය**

බස්නාහිර පළාත තුළ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ඉගෙනීම ලබන රජයේ පාසල්වල පැවැති විශේෂ අධ්‍යාපන ඒකක ගණන හා ඒවායේ අධ්‍යාපනය ලබන ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් විශේෂ පාසල්වල අධ්‍යාපනය ලබන බව පහත වගුව අනුව නිරීක්ෂණය විය.

2014 වර්ෂය

| කලාපය | රජයේ පාසල්වල පැවැති විශේෂ අධ්‍යාපන ඒකක සංඛ්‍යාව | එම පාසල්වල ඉගැනුම ලබන සිසුන් ගණන | විශේෂ පාසල් සංඛ්‍යාව | එම පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කොළඹ | 13 | 95 | 01 | 272 |
| ජයවර්ධන පුර | 13 | 97 | 02 | 55 |
| පිළියන්දල | 09 | 60 | 02 | 190 |
| හෝමාගම | 13 | 82 | - | - |
| ගම්පහ | 11 | 156 | 02 | 196 |
| කැළණිය | 16 | 122 | - | - |
| මිනුවන්ගොඩ | 16 | 122 | - | - |
| මීගමුව | 17 | 128 | 01 | 197 |
| හොරණ | 19 | 208 | 01 | 54 |
| කළුතර | 15 | 157 | 01 | 105 |
| මතුගම | 17 | 77 | 01 | 33 |

මෙම පාසල්වල අධ්‍යාපන කටයුතු නගා සිටු වීම සඳහා වැඩි අවධානයක් අදාළ ආයතන විසින් යොමුකර නොතිබුණු බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

**(i) විෂය නිර්දේශ වෙනස් වීම්වලට අදාළ වැඩමුළු සඳහා සහභාගී නොවීම.**

2015 වර්ෂයේ සිට 6 වසර හා 10 වසර විෂය නිර්දේශ වෙනස් වීම පිළිබඳව 2014 වර්ෂයේදී සියලුම පාසල්වල ගුරුවරුන් හට දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා තිබුණ ද, විශේෂ පාසල් 08ක ගුරුවරුන් 59දෙනෙකු එ වැනි වැඩසටහන් සඳහා යොමුකර නොතිබුණි.

**(ii) ගුරු උපදේශකවරුන්ගේ සහය නොලැබීම.**

රජයේ පාසල්වල ගුරුවරුන්ට අවශ්‍ය මගපෙන්වීම් සඳහා වරින්වර ගුරු උපදේශකවරුන්ගේ සහාය ඇතැම් පාසල්වලට ලැබුණ ද, විශේෂ පාසල් 06ක ගුරුවරුන් 34දෙනෙකුට එ වැනි උපදේශක සහායක් 2014 වර්ෂයේදී ලැබී නොතිබුණි.

**(ආ) අනෙකුත් වැඩමුළු, සම්මන්ත්‍රණ හා පුහුණුවීම් සඳහා අවස්ථාව නොලැබීම.**

විශේෂ පාසල්වල සේවය කරන ගුරුවරුන්ගේ විෂය දැනුම ඉහළ නැංවීම පිණිස සංවිධානය කර තිබුණු වැඩමුළු, සම්මන්ත්‍රණ හා පුහුණුවීම් වැනි දෑ සියලු ගුරුවරුන් හට අවස්ථාව ලැබෙන පරිදි සංවිධානය කර නොතිබුණි. ඒ අනුව ඇතැම් පාසල්වල ගුරුවරුන්ට මේ සඳහා කැඳවීම් කර නොතිබුණි. ඇතැම් විට එම කැඳවීම සන්නිවේදනය වී නොතිබුණි. එමෙන්ම, ඒවාට සහභාගී වීමේ වුවමනාවක් තිබුණ ද, ඒ සඳහා අවස්ථාවක් ලැබී නොතිබුණි. මේ අනුව, විශේෂ පාසල් 13ක ගුරුවරුන් 202දෙනෙකුගෙන් 51දෙනෙකු පමණක් සම්මන්ත්‍රණ සඳහා සහභාගී වී තිබුණු අතර බිහිරි ළමුන්ට අදාළ තොල් පාඨනය සම්බන්ධ වැඩමුළුවලට ගුරුවරුන් 38ක් ද, වෙනත් පුහුණු වීම් සඳහා ගුරුවරුන් 124ක් ද පමණක් සහභාගී වී තිබුණි.

**(ඇ) ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ නොලැබීම.**

විශේෂ පාසල්වල ගුරුවරුන් හට අවශ්‍ය ගුරු මාර්ගෝපදේශ (ගුරු අත්පොත්) ඇතැම් විශේෂ පාසල්වල ගුරුවරුන් හට ලැබී තිබුණ ද, විශේෂ පාසල් 11ක ගුරුවරුන් 51 දෙනෙකුට සිය විෂයට අදාළ ගුරු අත්පොත් ලැබී නොතිබුණි. මේ නිසා ඉගැන්වීමේ කටයුතු සතුටුදායක ලෙස ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

**(ඈ) විශේෂ පාසල් වලින් අධ්‍යාපනය නිම කිරීම.**

විශේෂ පාසල්වලින් 2013 හා 2014 වර්ෂවල දී අධ්‍යාපනය නිම කළ සිසුන් වෘත්තීය අධ්‍යාපනය වෙත පිවිසීමේ සතුටුදායක ප්‍රවණතාවක් නොතිබුණු බව විශේෂ පාසල් 25ක සිදු කළ පරීක්ෂාවේදී අනාවරණය විය. විස්තර පහත පරිදි ය.

| පාසල | 2013 වර්ෂය | | 2014 වර්ෂය | |
|---|---|---|---|---|
| | අධ්‍යාපනය නිම කළ සිසුන් ගණන | වෘත්තීය අධ්‍යාපනයට යොමු වූ සංඛ්‍යාව | අධ්‍යාපනය නිම කළ සිසුන් ගණන | වෘත්තීය අධ්‍යාපනයට යොමු වූ සංඛ්‍යාව |
| බ/ශ්‍රී සුදර්ශි අන්ධ බිහිරි විද්‍යාලය | 13 | 07 | 07 | 04 |
| ර/යසෝදරා අඳ බිහිරි විද්‍යාලය | 07 | නැත | නැත | නැත |
| බප/කො/සුකිත විශේෂ පාසල | 09 | 02 | 13 | 03 |
| බප/මතු/මයුර විශේෂ පාසල | 01 | නැත | 09 | 03 |
| බප/චිත්‍රලේත් පාසල | 12 | 05 | 10 | 01 |
| මහා සෙංකඩගල අඳ බිහිරි විදුහල | 15 | නැත | 11 | නැත |
| හලා/ මහවැව සිවිරාජ විශේෂ පාසල | 23 | 08 | 18 | 06 |
| බප/නෙත් සවන් සරණ ක. විදුහල | 05 | 04 | 08 | 06 |
| කු/සඳගල විශේෂ පාසල | 18 | 13 | 07 | 02 |
| | 103 | 39 | 83 | 25 |

**(ඉ) උපස්ථායකයින් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම.**

බස්නාහිර පළාත් සභාවේ 2006 අංක 03 දරන සමාජ සේවා ප්‍රඥප්තියේ 12 වන වගන්තිය යටතේ වූ 05 වන නියෝගය ප්‍රකාර ව සමාජ සේවා අධ්‍යක්ෂක සැහීමකට පත්වන පරිදි සුදුසු කාර්ය මණ්ඩලයක් ආබාධිත නිවාස සහ ආයතන සතු විය යුතු ය. එහෙත් ඇතැම් විශේෂ පාසල්වල කිසිදු උපස්ථායකයෙකු නොවීය. ඒ අනුව, 2014 වර්ෂයේ නිරීක්ෂණය කළ පාසල් 08ක නේවාසික ශිෂ්‍ය සංඛ්‍යාව 296ක් වුවද, එම නේවාසිකාගාරවල කිසිදු උපස්ථායකයෙකු සේවයේ යෙදී නොසිටි බව නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි විය.

| පාසල | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | නේවාසික ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| මාර/රෝහණ විශේෂ විදුහල | 123 | 59 |
| බ/ශ්‍රී සුදර්ශි අන්ධ හා බිහිරි පාසල | 158 | නැත |
| හලා/මහවැව සිව්රාජ විශේෂ පාසල | 94 | 49 |
| බප/හො/සුඛිත විශේෂ පාසල | 48 | 23 |
| ක/ශ්‍රී/ චන්ද්‍රසේකර විශේෂ පාසල | 70 | 55 |
| බප/මතු/මයුර විශේෂ පාසල | 29 | 15 |
| ගා/නෙත් සවන් සරණ ගා. විදුහල | 60 | 40 |
| රියෙන්සි අලගියවන්න අඳ බිහිරි විදුහල | 77 | 55 |
| | 659 | 296 |

**(ඊ) විශේෂ පාසල්වල ශිෂ්‍යයන්ගේ ආබාධිත උපකරණ අවශ්‍යතාව ඉටු නොකිරීම.**

විශේෂ පාසල් 08ක 2014 වර්ෂය තුළ අධ්‍යාපනය ලද ශිෂ්‍යයන්ට අවශ්‍ය සැරයටි, සවන් වහල්, බ්‍රේල් යන්ත්‍ර ආදී ආබාධිත උපකරණවල ඌනතාවක් පැවතියද ඒවා සපයා දී නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| | පාසල | 2014 වාර්ෂික අවශ්‍යතාව | | | 2014 සැපයුම් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | සැරයටි | සවන් වහල් | බ්‍රේල් යන්ත්‍ර | සැරයටි | සවන් වහල් | බ්‍රේල් යන්ත්‍ර |
| i. | මාර/රෝහණ විශේෂ විදුහල | 08 | 20 | 08 | - | - | - |
| ii. | බ/ශ්‍රී සුදර්ශි අන්ධ බිහිරි විද්‍යාලය | 15 | - | 12 | 10 | - | 06 |
| iii. | ර/යසෝදරා අඳ බිහිරි විද්‍යාලය | 05 | 49 | 01 | - | - | 01 |
| iv. | ගා/නෙත් සවන් සරණ ගා. විදුහල | - | 12 | 04 | - | 04 | 02 |
| v. | කු/සඳගල විශේෂ පාසල | - | 05 | 09 | - | 02 | - |
| vi. | රියෙන්සි අලගියවන්න අඳ බිහිරි විදුහල | - | - | 10 | - | - | - |
| vii. | අ/සෙන්කඩගල අඳ බිහිරි විදුහල | 10 | 103 | 04 | - | - | - |
| viii. | හලා/මහවැව සිව්රාජ විශේෂ පාසල | - | 04 | - | - | - | - |

**(උ) ශ්‍රවණාබාධිත සිසුන්ගේ විභාග ප්‍රතිඵල දුර්වල මට්ටමක පැවතීම.**

විශේෂ පාසල්වල ඉගෙනුම ලබන දෘෂ්‍යාබාධිත සිසුන්ගේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයේ හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල සතුටුදායක මට්ටමක පැවතියද, ශ්‍රවණාබාධිත සිසුන්ගේ එම විභාග ප්‍රතිඵල එ වැනි සතුටුදායක මට්ටමක නොපැවැතිණි. මේ අනුව පරීක්ෂාවට ලක් වූ පාසල් 3ක 2014 වර්ෂයේ ප්‍රධාන විෂයයන් පිළිබඳ ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේදී, දෘශ්‍යාබාධිත සිසුන් 57 දෙනෙකු විභාගයට පෙනී සිටි අතර ඉන් 41 දෙනෙකු විභාගය සමත් වී තිබුණි. එහෙත් ශ්‍රවණාබාධිත සිසුන් 109 දෙනෙකුම මේ විෂයයන් සඳහා විභාගයට පෙනී සිටි නමුත් සමත් වී තිබුණේ ඉන් සිසුන් 11 දෙනෙකු පමණි.

මෙම තත්ත්වයට පහත කරුණු හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

(i) සාමාන්‍ය දරුවන්ට නියමිත විෂය නිර්දේශයම මෙම දරුවන්ට ද ආවරණය කිරීමට සිදු ව තිබුණි. එහෙත් විශේෂ අවශ්‍යතා පැවතීම හේතුවෙන් නියමිත කාලපරිච්ඡේදය තුළ අදාළ විෂය නිර්දේශය ආවරණය කිරීමට මෙම ළමුන්ට නොහැකි වීම.

(ii) ඒ ඒ විෂයන්වලට අදාළ පාරිභාෂිත වචන සඳහා නියමිත සංඥා ස්ථාපිත කර නොතිබිම.

(iii) භාවිතා කරන සංඥා ප්‍රාදේශීය වශයෙන් වෙනස් වන අවස්ථා පැවතීම.

**(ඌ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) හා ශිෂ්‍යත්ව විභාගයේදී දෘශ්‍යාබාධිත සිසුන් මුහුණ දෙන ගැටළු**

විශේෂ පාසල්වල ඉගෙනීම ලබන දෘෂ්‍යාබාධිත ශිෂ්‍යයන් ශිෂ්‍යත්ව විභාගයේදී හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී මුහුණ දෙන ගැටළු පහත පරිදි විය.

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී මෙන්ම, ශිෂ්‍යත්ව විභාගයේදී ද පින්තූර, සිතියම්, චිත්‍ර ආදී මාධ්‍යවලින් ප්‍රශ්න ඉදිරිපත් කරන බැවින් එම ප්‍රශ්නවලට දෘශ්‍යාබාධිත සිසුන්ට ප්‍රවේශ වීමට හැකියාවක් නොමැති වීම.

උදා:- - A, B, C අක්ෂරවලින් ඇති කොටස් නම් කරන්න.
- හෘදයේ කොටස් ඊතලවලින් පෙන්වා නම් කරන්න.

(ii) දෘශ්‍යාබාධිත සිසුන්ගේ ප්‍රශ්න පත්‍රය බ්‍රේල් මාධ්‍යයට පරිවර්තනය කරන්නේ සිසුන් විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසුව ය. මේ නිසා ඔවුන්ට පැය ½ ක පමණ කාලයක් නිකරුණේ බලා සිටීමට සිදු වේ. එය ඔවුන්ගේ මානසික ඒකාග්‍රතාව කෙරෙහි බල පෑ හැක. එමෙන්ම, ප්‍රශ්න පත්‍රය සිසුන්ට කොටස් වශයෙන් ලැබෙන නිසා සම්පූර්ණ ප්‍රශ්න පත්‍රය පිළිබඳ එකවර තීරණය කර ගැනීමට නොහැකි වීම.

(iii) ගණිතය විෂය සඳහා විශේෂිත ප්‍රශ්න පත්‍රයක් අන්ධ සිසුන් වෙනුවෙන් ලබා දුන්න ද, ඒ සඳහා විෂය නිර්දේශයක් නොතිබීම.

(iv) විභාග ශාලාවේ රාජකාරි ඉටු කරන ගුරුවරුන් හට ආබාධිත දරුවන් පිළිබඳ මනා අවබෝධයක් හා දැනුවත් බවක් නොතිබීම. මේ නිසා ප්‍රශ්න පත්‍රයේ වූ ප්‍රශ්න සිසුන්ට ඇසෙන සේ කියවීමේදී ඒවා ඔවුන්ට තේරුම් ගැනීමට අපහසු වීම.

(v) සාමාන්‍ය දරුවන්ට ලබා දෙන පෙළ පොත්ම බ්‍රේල් මාධ්‍යයට හරවා ආබාධිත දරුවන් වෙත ලබා දේ. එම පොත්වල ඇති රූප සටහන් බ්‍රේල් මාධ්‍යයෙන්

ලබාදිය නොහැකි වුවද, රූප සටහන් ආශ්‍රිත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ආබාධිත දරුවන්ට සිදු වීම.

(vi) ශිෂ්‍යත්ව විභාගයේදී දෘෂ්‍යාබාධිත දරුවන් වෙනුවෙන් ප්‍රශ්න කියැවීමට පැමිණෙන ගුරුවරයා විෂයානුබද්ධ ගුරුවරයෙකු නොවීම එම දරුවන්ට අවාසි සහගත ලෙස බලපෑම. එනම්, විද්‍යාව විෂය නොදන්නා ගුරුවරයෙකු විද්‍යාව ප්‍රශ්න පත්‍රය කියැවීම හෝ සංගීතය නොදන්නා ගුරුවරයෙකු සංගීතය ප්‍රශ්න පත්‍රය කියැවීම වැනි අවස්ථා උදාහරණ ලෙස දැක්විය හැක.

(vii) දෘශ්‍යාබාධිත දරුවන් හට පුස්තකාල පොත් හා අනෙකුත් පොත්පත් කියවීම පහසු කරවන ක්‍රමවේදයක් වන්නේ, ස්කෑන් යන්ත්‍ර, ප්‍රකාශ අක්ෂර කියවීමේ යන්ත්‍ර (Optical Character Reader) වැනි මෘදුකාංගයන් සහිත යන්ත්‍ර සම්බන්ධ කර පරිගණක ආධාරයෙන් මුද්‍රිත යන්ත්‍ර හා ලිපි කියවීමේ ක්‍රමවේදයයි. එසේ කියවීමට හැකිවන සේ එම පහසුකම් සපයා නොතිබුණි.

**(ඵ) විශේෂ අධ්‍යාපනය සම්බන්ධ පුහුණුව ලැබූ ගුරුවරු වෙනත් පන්ති කාමර / පාසල්වලට යොමුවීම.**

අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක E.D./1/18/8/2/6 හා 2014 අගෝස්තු 22 දිනැති චක්‍රලේඛය අනුව විශේෂ අවශ්‍යතා සහිත සිසුන් වෙනුවෙන් විශේෂ අධ්‍යාපන ඒකක ආරම්භ කිරීම හා ගුරුවරුන් පත්කිරීම සම්බන්ධව විදුහල්පතිවරුන් දැනුවත් කර තිබුණි. එහෙත් 2014 වර්ෂය තුළ පළාත් 09හි පැවැති විශේෂ අධ්‍යයන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 411ක් විය. එසේ වුවද, විශේෂ අධ්‍යයන ගුරු පුහුණුව ලද ගුරුවරුන් 355ක් වෙනත් පාසල්/පංති කාමරවල සේවයේ යෙදී සිටි බව දක්නට ලැබුණි. විස්තර පහත පරිදි විය.

2014 වර්ෂය

| පළාත | මුළු පුරප්පාඩු සංඛ්‍යාව | විශේෂ අධ්‍යාපන පත්වීම්ලබා සාමාන්‍ය පංතිකාමරවල සේවයේ යෙදෙන සංඛ්‍යාව |
|---|---|---|
| බස්නාහිර | 164 | 56 |
| මධ්‍යම | 40 | 36 |
| දකුණ | 30 | 69 |
| වයඹ | 36 | 31 |

| | | |
|---|---|---|
| උතුරු මැද | 24 | 42 |
| උතුර | 51 | 19 |
| නැගෙනහිර | 28 | 48 |
| ඌව | 08 | 25 |
| සබරගමුව | 35 | 29 |
| එකතුව | 411 | 355 |

**(ඒ) විශේෂ අධ්‍යාපන ඒකක සහිත දෙමළ මාධ්‍යය පාසල්**

බස්නාහිර පළාත තුළ පිහිටුවා ඇති අධ්‍යාපන කොට්ඨාශ 38ක 2015 මැයි 13 දිනට පාසැල් 161ක සිංහල මාධ්‍යයෙන් විශේෂ අධ්‍යාපන ඒකක ස්ථාපනය කර තිබුණ ද, දෙමළ මාධ්‍ය විශේෂ අධ්‍යාපන ඒකක ස්ථාපිත කර තිබුණේ 04ක් පමණි. කෙසේ නමුත්, බස්නාහිර පළාත් විශේෂ අධ්‍යාපන ඒකකය මගින් දෙමළ මාධ්‍යය සඳහා මෙ වැනි ළමුන්ගේ සංඛ්‍යාව කොපමණ යන්න පිළිබඳ ඇගයීමක් කර නොතිබුණි.

**නිර්දේශ**

(i) සෑම අධ්‍යාපන කලාපයකටම විශේෂ අධ්‍යාපන විෂය අධ්‍යක්ෂකවරුන් පත් කිරීම හා විශේෂ අධ්‍යාපන ගුරු උපදේශකවරුන් සෑම අධ්‍යාපන කොට්ඨාශයකටම අනුයුක්ත වන පරිදි බඳවා ගැනීම.

(ii) විශේෂ අධ්‍යාපනය පිළිබඳ පුහුණුව ලැබූ ගුරුවරුන් වෙනත් පන්ති කාමරවලට හා පාසල්වලට යොමු වීම වැළැක්වීම.

(iii) විශේෂ අධ්‍යාපන ඒකකවලට අවශ්‍ය අධ්‍යාපනික උපකරණ ප්‍රමාණවත් පරිදි සපුරාලීම හා සාමාන්‍ය පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක ස්ථාපිත කිරීමේදී හැකිතාක් රෝද පුටු , අත්වාරු හා සුදු සැරයටි ආදිය භාවිතා කරන ළමුන්ට පැමිණීමට පහසු ප්‍රවේශ මාර්ග සහිත ස්ථානයක ඒවා ස්ථාපිත කළ යුතු වීම.

(iv) රජයේ පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක සඳහා වූ පන්ති කාමර පවත්වා ගෙන යාම සඳහා ප්‍රමිතීන් හඳුන්වා දීම.

(v) වරින් වර සිදුවන විෂය නිර්දේශ වෙනස්වීම් සඳහා පවත්වන පුහුණු වැඩසටහන් හා සම්මන්ත්‍රණ ආදිය සඳහා විශේෂ අධ්‍යාපන ඒකක හා උපකෘත පාසල්වල ගුරුවරුන්ද සම්බන්ධ කර ගැනීම.

(vi) ශිෂ්‍යත්ව විභාගය සඳහා මෙන්ම අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාග සඳහා විභාග පරීක්ෂකවරුන් යොදා ගැනීමේදී විභාගයට පෙනී සිටින විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ මානසික මට්ටම හා ආබාධයේ ස්වභාවය පිළිබඳව හා විෂය පිළිබඳ අවබෝධයක් ඇති පරීක්ෂකවරුන් අනුයුක්ත කිරීම.

(vii) බ්‍රේල් පෙළ පොත් මුද්‍රණය හා බෙදාහැරීම විධිමත් කර අවශ්‍ය සියලු ගුරුවරුන්ට ඒවා නිසි වෙලාවට බෙදා හැරීම සිදු කිරීම.

(viii) සිසුන් නේවාසිකව අධ්‍යාපනය ලබන උපකෘත පාසල්වල සිටිය යුතු උපස්ථායකයින් සංඛ්‍යාව පිළිබඳ නිශ්චිත පිරිවිතර සකස් කිරීම හා එම සංඛ්‍යාව සෑම උපකෘත පාසලකටම ලබා දීම.

(ix) බිහිරි ළමුන්ගේ අධ්‍යාපන ප්‍රතිඵල ඉතාම පහළ මට්ටමක පවතින බැවින් ප්‍රමිතිගත සංඥා භාෂාවක් හඳුන්වා දීම.

**ආයතනයේ අදහස් දැක්වීම**

''විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට අධ්‍යාපනය ලබාදීමේ වඩාත් යෝග්‍ය ක්‍රමය ලෙස නූතන පිළිගැනීම වන්නේ අන්තර්කරණ අධ්‍යාපනයයි. මේ අනුව ඉදිරියේදී විශේෂ පාසල් හා විශේෂ අධ්‍යාපන ඒකකවලට සිසුන් යොමු කිරීම වෙනුවට සාමාන්‍ය පන්තිවලට විශේෂ අවශ්‍යතා සහිත සිසුන් යොමු කිරීම එනම් අන්තර්කරණය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. "

## 3.2 ආබාධිත පුද්ගලයන් සඳහා ලබාදෙන වෘත්තිය පුහුණුව සම්බන්ධ නිරීක්ෂණ

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආබාධිත වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත දැක්වේ.

### 3.2.1 වෘත්තීය පුහුණු අධ්‍යාපනය සාර්ථකව නිම කිරීම.

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වෘත්තිය පුහුණු මධ්‍යස්ථානවලට අභ්‍යාසලාභින් බඳවා ගැනීම හා ඔවුන් විසින් පුහුණුව නිමකර ඉවත්ව යාම පිළිබඳව 2013 හා 2014 වර්ෂවලට අදාළ ව තොරතුරු පරීක්ෂා කිරීමේදී බඳවා ගත් සංඛ්‍යාව සහ පිට වූ සංඛ්‍යාව අතර පහත පරිදි වෙනස්කම් පැවැතිණි.

| වෘත්තීය පුහුණු ආයතනය | වර්ෂය 2013 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| | බඳවාගත් සංඛ්‍යාව | පුහුණුව අවසන් කළ සංඛ්‍යාව | වෙනස | බඳවාගත් සංඛ්‍යාව | පුහුණුව අවසන් කළ සංඛ්‍යාව | වෙනස |
| සීදූව | 123 | 62 | 61 | 107 | 61 | 49 |
| කැටවල | 45 | 03 | 42 | 43 | 11 | 32 |
| වත්තේගම | 79 | 61 | 18 | 110 | 55 | 55 |
| තෙළඹුයාය | 66 | 13 | 53 | 110 | 61 | 49 |
| අමුණුකුඹුර | 55 | 10 | 45 | 56 | 29 | 27 |
| | 368 | 149 | 219 | 426 | 217 | 212 |

ඉහත තොරතුරු අනුව, බඳවාගත් අභ්‍යාසලාභින්ගෙන් සියයට 60ක ප්‍රමාණයක් 2013 වර්ෂයේදී ද, සියයට 49ක ප්‍රමාණයක් 2014 වර්ෂයේදී ද පාඨමාලා සම්පූර්ණ කිරීමට අසමත් ව තිබුණි. එනම්, පාඨමාලා පවත්වා වෘත්තීය හැකියාව ලබා දී ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමේ අරමුණ නිසි පරිදි ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 3.2.2 කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම.

වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා අනුමත මේට්‍රන් තනතුරු සංඛ්‍යාව 12දෙනෙකු වුවද, ඉන් තනතුරු 08ක්ම 2014 වසර පුරාම පුරප්පාඩුව පැවැතිණි. එය නේවාසිකාගාර පාලනය නිසි පරිදි පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි.

### 3.2.3 පුහුණුව සම්පූර්ණ කළ සිසුන් සම්බන්ධ පසු විපරම් කටයුතු සිදු කිරීම.

විගණනයට භාජනය කළ වෘත්තිය පුහුණු මධ්‍යස්ථානවල පුහුණුව නිම කළ සිසුන් සම්බන්ධයෙන් සිදු කළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) පුහුණුව නිම කළ සිසුන්ට කුමන හෝ රැකියාවක් ලබා දීමට දෙපාර්තමේන්තුව හෝ වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන සෘජු ලෙස මැදිහත් වී නොතිබුණි. වෘත්තීන්වලට ඉල්ලුමක් ඇති ආයතන හා මෙම ළමුන් අතර සබඳතාවක් ඇති නොකිරීම උදාහරණයක් ලෙස දැක්විය හැක.

(ii) වෘත්තීය පුහුණු කටයුතු සඳහා සෘජු වියදම් ලෙස 2014 වසර තුළ දළ වශයෙන් රු.48,960,889ක් වැය කර තිබූ අත.ර එම මුදලට සාපේක්ෂව ආබාධිත පුද්ගලයන් ලබාගත් වෘත්තීය පුහුණුව මගින් ඔවුන් ආර්ථික වශයෙන් සවිබල වූයේ ද යන්න නිශ්චිත ලෙස තහවුරු කරගෙන නොතිබුණි.

### 3.2.4 අරමුදල් සම්පාදනය

ඉහත නිරීක්ෂණ අනුව මෙම කාර්යය ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස අරමුදල් සම්පාදනය කරගත යුතු වේ. මේ සම්බන්ධයෙන් කළ පරීක්ෂාවේදී අනාවරණය වු පරිදි පසුගිය වසර 4ක කාලය තුළ භාණ්ඩාගාරය වෙතින් වාර්ෂික අරමුදල් ඉල්ලුම් කළ වටිනාකමින් පුනරාවර්තන වියදම් සඳහා සියයට 17.35ක් ද, ප්‍රාග්ධන වියදම් සඳහා සියයට 29.12ක් ද ලෙස අරමුදල් ලැබී නොතිබුණි. මේ නිසා ඉදිරි වැඩසටහන් හෝ විශේෂ ව්‍යාපෘති සඳහා අරමුදල් ඉල්ලුම් කිරීමේදී අදාළ අවශ්‍යතා තහවුරු වන ලෙස එම වැඩසටහන් හෝ ව්‍යාපෘතිවල සවිස්තර වාර්තා ද සමඟ භාණ්ඩාගාරය වෙතින් ඉල්ලුම් කිරීමෙන් ප්‍රමාණවත් අරමුදල් නොලැබීම පිළිබඳ ගැටලුව යම් ප්‍රමාණයකට අවම කරගත හැකිවන බව නිරීක්ෂණය විය.

**නිර්දේශ**

(අ) වෘත්තීය පුහුණු කටයුතු සඳහා අවශ්‍ය උපකරණ අප්‍රමාදව ලබා දීමට කටයුතු කිරීම.

(ආ) වෘත්තීය පුහුණුව නිම කළ සිසුන් පිළිබඳ අඛණ්ඩ පසු විපරම් වාර්තාවක් වසර දෙකක් හෝ ඊට වැඩි කාලයක් යනතුරු සමාජ සේවා නිලධාරීන් මගින් ලබා ගැනීමට කටයුතු කිරීම.

(ඇ) වෘත්තීය උපදේශක තනතුරු පුරප්පාඩු පිරවීමට අප්‍රමාදව කටයුතු කිරීම.

## 04. නිගමන

(අ) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සිටින විශේෂ අධ්‍යාපන ඒකක හා උපකෘත පාසල් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ මට්ටමින් හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මට්ටමින් හිමි විය යුතු අවධානය ප්‍රමාණවත් නොවීමෙන් එම ළමුන්ට අධ්‍යාපනයේ සම අවස්ථා අහිමි වන බව නිගමනය කෙරේ.

(ආ) වෘත්තීය අධ්‍යාපන කටයුතු සඳහා දිරි දෙමින් හා විශාල පිරිවැයක් දරමින් තම දෙපයින් නැගී සිටිය හැකි අභිමානවත් පිරිසක් බිහි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව ගෙන ඇති උත්සාහය සාර්ථක කර ගැනීමට අනුගමනය කරන පසු විපරම් ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන බව නිගමනය කෙරේ.